ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2025-10-28

| | | |
|---|---|---|
| පැමිණිලිකාර පාර්ශවය | : | ඇන්තනී ප්‍රකාශ් මයා,<br>10/8, රොක්සි වත්ත නිවාස ක්‍රමය,<br>වැල්ලවත්ත. |
| වගඋත්තරකාර පාර්ශවය | 01 | විදුහල්පති,<br>හින්දු විද්‍යාලය,<br>කොළඹ 04. |
| | 02 | විදුහල්පති,<br>රාජකීය විද්‍යාලය,<br>කොළඹ 07. |
| | 03 | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,<br>කලාප අධ්‍යාපන කාර්යාලය,<br>විතානගේ මාවත.<br>කොළඹ 02. |
| | 04 | ලේකම්,<br>අධ්‍යාපන අමාත්‍යාංශය,<br>ඉසුරුපාය,<br>බත්තරමුල්ල. |




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක. 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு - 04. / No. 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairman: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

**පැමිණිලි අංකය : එච්ආර්සී/542/25**

**පැමිණිල්ල**

පැමිණිලිකරු විසින් මෙම කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ පැමිණිලිකරු උපතින් ද්‍රවිඩ ක්‍රිස්තියාන් ලබ්දික තැනැත්තෙකු වන අතර පැමිණිලිකරුගේ භාර්යාව ද ද්‍රවිඩ ක්‍රිස්තියානි ලබ්දිකාවක් බවත් පැමිණිලිකරුගේ දරුවා වන ප්‍රකාශ් ජුවාන් යන අය 2025 වර්ෂය වෙනුවෙන් පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීමේ අරමුණෙන් කොළඹ 04 හි පිහිටා ඇති හින්දු විද්‍යාලය වෙත අයදුම්පත්‍රයක් ඉදිරිපත් කළ නමුත් චක්‍රලේඛයේ 4:2 වගන්තිය අනුව එකී අයදුම්පත ප්‍රතික්ෂේප කර ඇති බවට දැනුම් දීමක් ලැබුණු බවයි.

ඉන් අනතුරුව කොළඹ රාජකීය විද්‍යාලයට පළමු ශ්‍රේණිය සඳහා පාසලට ආසන්න පදනම මත අයදුම් කළ බවත් මුල් අවස්ථාවේදී එකී අයදුම්පත ප්‍රතික්ෂේප කර තිබුණද ඉන් පසුව කරන ලද අභියාචනයේදී අයදුම්පත සළකා බලා සම්මුඛ පරීක්ෂණය සඳහා ද කැඳවූ බවයි. කොළඹ රාජකීය විදුහල විසින් පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේදී ලබාදී ඇති ලකුණු ප්‍රමාණය සළකා බැලීමේදී පදිංචිය සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ලේඛනය සඳහා ලකුණු 06 ක් ලබාදී ඇති නමුත් ඒ සඳහා ලකුණු 20 ක් ලැබියයුතු බවත් ඔවුන්ගේ පදිංචි ස්ථානයේ සිට එකී පාසල සඳහා ඇති දරුවාට ඇතුළත් වියහැකි පාසල් සඳහා ලකුණු 35 ක් ඉවත් කිරීමෙන් පසුව ලකුණු 15 ක් ලබාදී ඇති නමුත් ඔවුන් විසින් ලකුණු කපා හැරීමට ලැයිස්තු කර ඇති පාසල් 07 න් එක් පාසලක් වන්නේ හින්දු විදුහල නමුත් එම පාසලේ ක්‍රිස්තියානි ආගමේ ළමුන් ඇතුළත් කර ගැනීමට අවස්ථාවක් නොමැති බැවින් එකී පාසල සඳහා කපා ඇති ලකුණු 05 ක ප්‍රමාණය නැවත ලබාදිය යුතු බවත් සඳහන් කර සිටී. අනෙකුත් ලකුණු සම්බන්ධයෙන් ගැටළු නොමැති බවත් සඳහන් කර සිටී.

ඉන් අනතුරුව එකී පාසල සඳහා අභියාචනයක් ඉදිරිපත් කළද කිසිදු වෙනසක් සිදු නොවූ බැවින් පැමිණිලිකරුගේ දරුවාට පළමු ශ්‍රේණිය සඳහා කිසිදු පාසලකට ප්‍රවේශ වීම සඳහා අවස්ථාව හිමි වී නොමැති බවට වැඩිදුරටත් දන්වා ඇත. කොමිෂන් සභාව විසින් මෙම පැමිණිල්ලට අදාළව පවත්වන ලද පරීක්ෂණයේදී සිදු කරන ලද විමසීමේදී පැමිණිලිකරු විසින් දන්වා ඇත්තේ එම පාසල් දෙක සඳහා ප්‍රවේශ වීමට තිබූ අවස්ථාව අහිමි වීම හේතුවෙන් දරුවාගේ අධ්‍යාපන කටයුතු සළකා බලා මේ වනවිට වෙනත් පාසලකට ඇතුළත් කර තිබෙන නමුත් ක්‍රිස්තියානි ආගමේ ළමුන් ඇතුළත් කර ගැනීමට අවස්ථාවක් නොමැති පාසලක් සඳහා ලකුණු 05 ක් ඉවත් කිරීම හේතුවෙන් දරුවාට කොළඹ රාජකීය විදුහලට ප්‍රවේශ වීමට තිබූ අයිතිවාසිකම් අහිමි වීම හේතුවෙන් දරුවාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති බැවින් මේ පිළිබඳව නිර්දේශයක් ලබා දෙන ලෙසට ඉල්ලා ඇත.

**<u>01 වන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම</u>**

කොළඹ 04 පිහිටා ඇති හින්දු විද්‍යාලයට පළමු ශ්‍රේණිය සඳහා ළමුන් ඇතුළත් කර ගැනීමේදී සම්පූර්ණයෙන්ම හින්දු ආගමට අයත් ළමුන් පමණක් ඇතුළත් කර ගන්නා බවත් එය සම්ප්‍රදායක් ලෙස වර්ෂ 1951 සිට එනම් මෙම විදුහල ආරම්භ කරන ලද වර්ෂයේ සිට පවත්වාගෙන එනු ලබන සම්ප්‍රදායක් බවට කරුණු ඉදිරිපත් කර ඇති අතර 1 ශ්‍රේණිය සහ 6 වන ශ්‍රේණිය හැර 2 ශ්‍රේණියේ සිට උසස්පෙළ දක්වා ළමයින් ප්‍රවේශ වීම සඳහා අවස්ථාවක් ලබා දෙන බවත් ක්‍රිස්තියානි ආගම විෂයක් වශයෙන් එම පාසලේ ඉගැන්වීම සිදු කරනු ලබන බවත් කරුණු ඉදිරිපත් කර ඇත.

**<u>02 වන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම</u>**

පැමිණිලිකරුගේ දරුවා වන ප්‍රකාශ් ජුවාන් 2025 වර්ෂයේ කො/රාජකීය විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා "පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ දරුවන් ගණය" යටතේ දෙමළ මාධ්‍ය සඳහා අයදුම්පතක් ඉදිරිපත් කර තිබූ බවත් එම අයදුම්පත සමග ඉදිරිපත් කර ඇති ලේඛන සළකා බැලීමක් සිදු කරන ලද බවත් සඳහන් කර ඇත.

එහිදී අයදුම්පතෙහි සඳහන් කර ඇති ලිපිනයෙහි නිවාස අංකය 480/10/08 ලෙස සඳහන් කර ඇතත් පැමිණිලිකරුගේ ජාතික හැඳුනුම්පතෙහි ලිපිනය 81/3, හැව්ලොක් පාර, කොළඹ 05 ලෙසත් අයදුම්කරුගේ බිරිඳගේ ජාතික හැඳුනුම්පතෙහි ලිපිනය 10/8, රොක්සි උද්‍යානය, වැල්ලවත්ත, කොළඹ 06 ලෙසත් 2020.07.13 දිනැති බදු ගිවිසුමෙහි නිවසේ අංකය 10/08 ලෙසත් සඳහන්ව ඇති බවට නිරීක්ෂණය වීම හේතුවෙන් නිවාස අංකයන් නොගැලපීම සහ මෙම අංක දෙකම එකම නිවාස ඒකකයක් බව තහවුරු කෙරෙන ලේඛනයක් හෝ නොමැති වීම නිසා අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කර ඇති බවට වැඩිදුරටත් දන්වා ඇත.

පසුව නැවත සළකා බැලීම සඳහා යොමු කර ඇති අයදුම්පතට අනුව නිවැරදි ලිපිනය සහිතව යොමු කරන ලද පදිංචිය තහවුරු කිරීමේ ලේඛන සඳහා ලකුණු 06 ක් ලබා දී ඇති බවත් පදිංචි ලිපිනය සනාථ කරන වෙනත් පිළිගත හැකි ලේඛන පරීක්ෂා කිරීමෙන් පසුව එම ලේඛන සඳහා ලකුණු ලබා දෙන ලද බවත් චක්‍රලේඛනයට අනුව ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ අනෙකුත් සුදුසුකම්ද පරීක්ෂා කර ලකුණු ලබා දිය හැකි උපරිම ලකුණු ප්‍රමාණය 47.85 ක් ලබාදී ඇති බවයි. එහිදී මෙම පැමිණිලිකරු විසින් පදිංචිය සනාථ කිරීම සඳහා ඉදිරිපත් කර තිබුණේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ලබාදී ඇති බදු ගිවිසුමක් බවත් එකී බදු ගිවිසුම 2020 ජුලි 13 වන දින සිට 2024.06.30 වන දින දක්වා වූ කාලය පිළිබඳව සළකා බැලීමේදී අවුරුදු 03 යි මාස 11 දින 17 ක් බැවින් වසර 03 කට වැඩි වසර 04 කට අඩු යන නිර්ණායකය

අයත් වන බැවින් ඒ සඳහා වෙන් කර ඇති ලකුණු 06 මෙම පැමිණිලිකරු වෙත ලබාදී ඇති බවත් වැඩිදුරටත් දන්වා ඇත.

තවද ඒ සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු 10 ලබාදීමට නම් අවුරුදු 05 ක් සම්පූර්ණ වියයුතු බවත් පැමිණිලිකරු විසින් ඉල්ලා සිටින පරිදි ලකුණු 20 ලබාදීමට නම් පදිංචිය සනාථ කිරීමේ ලේඛනය සින්නක්කර ඔප්පුවක් වියයුතු බවත් දන්වා ඇත. එහෙයින් ඉහත කරුණු සළකා බැලීමෙන් පසුව අභියාචන හා විරෝධතා මණ්ඩලය විසින් ද ඉහත ලකුණු ප්‍රමාණය සංශෝධනය කර නොතිබුණු බවට වැඩිදුරටත් දන්වා ඇත.

<u>03 වගඋත්තරකරුගේ කරුණු දැක්වීම</u>

කොළඹ අධ්‍යාපන කලාපයට අයත් පාසල් වලින් පළමු ශ්‍රේණිය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේදී ආගමික ප්‍රතිශත සම්බන්ධයෙන් ලිඛිත සාක්ෂි කිසිවක් නොමැති අතර කොළඹ කලාපයේ පාසල් බොහොමයක් ආගමික සිද්ධස්ථාන ආශ්‍රිතව ආරම්භ වී පවත්වාගෙන පැමිණ පසුකාලයේදී රජයට පවරා ගන්නා ලද පාසල් වන බවත් එසේ පවරා ගෙන රජයේ පාසලක් බවට පත් වුවද බොහොමයක් පාසල් රජයට පවරා ගැනීමට පෙර එම පාසලේ පැවති ආගමික ප්‍රතිශත වර්තමානයේද පවත්වාගෙන යනු ලබන බවත් මෙය අදාළ පාසල් වල අනන්‍යතාවය හා සංස්කෘතිය මත පැවතගෙන එනු ලබන බවත් කරුණු ඉදිරිපත් කර ඇත.

<u>04 වන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම</u>

මෙම පැමිණිල්ලට අදාළව 2025.06.04 දින පවත්වන ලද පරීක්ෂණ කටයුතු සඳහා පෙනී සිටින ලද අධ්‍යාපන අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ එම්.සී. පලාවෙල මිය විසින් මෙම කොමිෂන් සභාව හමුවේ ඉදිරිපත් කර ඇත්තේ පැමිණිලිකරුට අසාධාරණයක් සිදුවී ඇති අංශ වශයෙන් ඔවුන් දක්වන පදිංචි සහතිකය සඳහා ප්‍රමාණවත් ලකුණු නොලැබීම සහ දරුවාට ඇතුළත් වියහැකි වෙනත් පාසල් අතුරින් හින්දු විද්‍යාලය සඳහා ලකුණු අඩු කිරීම යන කරුණු සළකා බැලීමේදී අදාළ අයදුම්කරුට නිවාස සංවර්ධන අධිකාරිය විසින් 2020.07.13 දිනැතිව ලබාදී ඇති බදු ගිවිසුම අනුව අදාළ අයදුම්කරුට වසර 03 යි මාස 11 යි දින 17 ක කාලයක් පමණක් හිමිකම පවතින බැවින් චක්‍රලේඛ ප්‍රකාරව පාසල විසින් ලබාදී ඇති ලකුණු නිවැරදි බව නිරීක්ෂණය වන බවයි.

අයදුම්කරු විසින් පවසන ආකාරයට මව සහ පියා දෙදෙනාම ක්‍රිස්තියානි ආගමික බැවින් හින්දු විද්‍යාලයට ඇතුළත් වීම සඳහා 1 ශ්‍රේණියට අයදුම් කළත් එම අයදුම්පත ප්‍රතික්ෂේප වූ බව පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධව හින්දු විද්‍යාලයේ විදුහල්පතිවරයාගෙන් දුරකථන මාර්ගයෙන් කරුණු

විමසීමක් සිදු කළ බවත් එයින් දැනගැනීමට ලැබුණේ 1 වන ශ්‍රේණිය සඳහා එලෙස ඇතුළත් කිරීම සිදු නොකළත් අතරමැදි ශ්‍රේණි සඳහා ඇතුළත් කිරීමේදී අනිකුත් ආගමික දරුවන් ද ඇතුළත් කිරීම සිදු කරන බවත් ක්‍රිස්තියානි ආගම විෂයක් වශයෙන් පාසලේ ඉගැන්වීම් කටයුතු සිදු කරන බවත් ය.

**නිරීක්ෂණ**

පැමිණිලිකරුගේ දරුවා වන ප්‍රකාශ් ජුවාන් යන අය පළමු ශ්‍රේණිය සඳහා ඇතුළත් කර ගැනීමට පැමිණිලිකරු විසින් මුල් අවස්ථාවේදී කොළඹ 04 හින්දු විද්‍යාලය වෙත අයදුම්පතක් ඉදිරිපත් කර ඇති නමුත් එම පාසල ආරම්භ කරන ලද 1951 වර්ෂයේ සිට පවත්වාගෙන එනු ලබන සම්ප්‍රදායක් වන පළමු ශ්‍රේණිය සහ 6 ශ්‍රේණිය සඳහා හින්දු ආගමික සිසුන් පමණක් ඇතුළත් කර ගැනීමේ ක්‍රියාපිළිවෙතක් අනුගමනය කිරීම හේතුවෙන් පැමිණිලිකරුගේ අයදුම්පත ප්‍රතික්ෂේප වී ඇති බවට නිරීක්ෂණය වේ.

මේ පිළිබඳව අධ්‍යක්ෂ තුමා විසින් නිකුත් කර ඇති පාසල්වල පළමු ශ්‍රේණියට ළමුන් ඇතුලත් කිරීමට අදාළ වන චක්‍ර ලේඛ අංක 25/2024 හි 7.2.4 හි සඳහන් කරුණු කොමිෂන් සභාව වින් සලකා බලන ලදි. එහි සඳහන් කර ඇත්තේ,

> "දැනට පදිංචි ස්ථානයේ සිට ඉල්ලුම් කරනු ලබන පාසලට වඩා ආසන්න වූ, ළමයාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් නොමැත්තේ නම් උපරිම ලකුණු ලබා දිය යුතුය. ඉල්ලුම් කරන පාසලට වඩා පදිංචි ස්ථානයට ආසන්න වූ හා ළමයාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් පිහිටා ඇත්නම් උපරිම ලකුණු ප්‍රමාණයෙන් ආසන්න ප්‍රමාණයෙන් ආසන්න එක් එක් පාසලක් වෙනුවෙන් ලකුණු 5 බැගින් අඩු කළ යුතුය. "
>
> (ළමයාට ඇතුළත් වීමට හැකි ප්‍රාථමික අංශ සහිත වෙනත් රජයේ පාසල් යනුවෙන් අදහස් කරන්නේ එම ළමයාට ඇතුළත් වීමට හැකි ඉගෙනුම මාධ්‍යය සහිත පාසලක්, තමන්ට අදාළ ගැහැණු හෝ පිරිමි පාසලක් ද, මිශ්‍ර පාසලක් ද යන්න සහ ළමයා අයිති ආගම වෙනුවෙන් 10% හෝ ඊට වැඩි ප්‍රතිශතයක් ඇතුළත් කර ගන්නා රජයේ පාසල් වේ. එහෙත් ආගමික ප්‍රතිශතයක් සඳහන් නොවන පාසල් සඳහා ඕනෑම ආගමක සිසුන්ට ඇතුළත් වීමට හැකිය.

යනුවෙන් වේ.

මේ අනුව ඉහත 1 වන වගඋත්තරකාර හින්දු විදුහල වෙත පළමු ශ්‍රේණිය සඳහා 100 % ක් අදාළ කරගනු ලබන්නේ හින්දු ආගමික ළමුන් වන බැවින් ක්‍රිස්තියානි ආගමික පැමිණිලිකරුගේ දරුවාට ඇතුළත්වීමට හැකියාවක් නොපවතින බව පැහැදිලි වේ.

එහෙයින් පළමු වගඋත්තරකාර පාර්ශවය විසින් ක්‍රිස්තියානි ලබ්ධිකයකු වන පැමිණිලිකරුගේ දරුවා පළමු ශ්‍රේණියට ඇතුළත් කර ගැනීමට ප්‍රතික්ෂේප කිරීම මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමක් බවට නිගමනය කළ නොහැක.

හින්දු විදුහලෙන් පැමිණිලිකරුගේ දරුවාට පළමු ශ්‍රේණිය සඳහා ප්‍රවේශ වීමට අවස්ථාවක් හිමි නොවීම මත පැමිණිලිකරු විසින් තම දරුවා කොළඹ රාජකීය විදුහලේ පළමු ශ්‍රේණියට ඇතුළත් කර ගැනීම සඳහා අයදුම්පතක් ඉදිරිපත් කළ මුල් අවස්ථාවේදී එය ප්‍රතික්ෂේප වී ඇති බවට නිරීක්ෂණය වන අතර පසුව පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද අභියාචනා දෙකටම සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණිලිකරු කැඳවා ඇති බවටද කරුණු පැහැදිලි වේ.

පැමිණිලිකරු විසින් පැමිණිල්ලේ සඳහන් කර ඇත්තේ ඉහත කී සම්මුඛ පරීක්ෂණයේදී පදිංචිය සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ලේඛනය එනම් නිවාස සංවර්ධන අධිකාරියට අයත් බදු ගිවිසුම සඳහා ලකුණු 6 ක් ලබාදී ඇති නමුත් එකී බදු ගිවිසුමේ 3 වන කොන්දේසියට අනුව එම බදු ගිවිසුමට එළඹෙනුයේ පැමිණිලිකරුගේ නමින් සින්නක්කර ඔප්පුවක් ලබා දෙන තුරු බවත් එම දේපලේ නීත්‍යානුකූල හිමිකරු පැමිණිලිකරු බව සඳහන් කරමින් 2024.09.13 දිනැති ලිපියක් ද පැමිණිලිකරුට ලබාදී ඇති බවයි. එහෙයින් ලකුණු 6 ට වඩා වැඩි අගයක් ලැබිය යුතු බවට පැමිණිලිකරු විසින් සඳහන් කර ඇති කාරණාව පිළිබඳව සළකා බැලීමේදී අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2025 වර්ෂයේ පාසල් වල පළමු ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීමට අදාළ වන චක්‍රලේඛ අංක 25/2024 අනුව පැමිණිලිකරුවන් අදාළ පදිංචි ස්ථානයේ සම්මුඛ පරීක්ෂණ දින වනවිට පදිංචිව සිට ඇත්තේ අවුරුදු 3 ක් වන බැවින් වගඋත්තරකරු විසින් ඒ සඳහා චක්‍රලේඛය පරිදි ලකුණු ලබාදී ඇති බවට නිරීක්ෂණය කෙරේ.

පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති අනෙකුත් ගැටළුව, පළමු ශ්‍රේණිය සඳහා ඇතුළත් වීමට හැකි පාසල් සඳහා ලකුණු අඩු කිරීමේදී ද්‍රවිඩ භාෂා මාධ්‍යය පළමු ශ්‍රේණිය සඳහා ඇතුළත් වීමට හැකි පාසල් සඳහා ලකුණු අඩු කිරීමේදී ද්‍රවිඩ භාෂා මාධ්‍යය පළමු ශ්‍රේණිය සඳහා පවත්වාගෙන යනු ලබන පාසල් 7 ක් වෙනුවෙන් ලකුණු අඩු කර ඇති බවයි. එකී පාසල් 7 අතරට කොළඹ හින්දු විද්‍යාලය ද ඇතුළත් බවත් ය. එහෙත් එම පාසලේ පළමු ශ්‍රේණියට ඇතුළත් කරනු ලබන්නේ හින්දු ආගමිකයින් පමණක් වන බැවින් එම පාසල සඳහා අඩු කරන ලද ලකුණු 5 පැමිණිලිකරුට හිමි විය යුතු බවයි.

මෙම කාරණා පිළිබඳව සළකා බැලීමේ දී අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2025 වර්ෂයේ පාසල් වල පළමු ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීමට අදාළ වන චක්‍රලේඛ අංක 25/2024 හි 7.2.4

වගන්තියේ විශේෂයෙන්ම සඳහන් කර ඇත්තේ '**ප්‍රවේශවීමට හැකි පාසල්**'සඳහා ලකුණු අඩු කිරීමක් සිදු කරනු ලබන බවයි. මෙම පැමිණිල්ලේ ඉදිරිපත් කර ඇති ඉහත නිරීක්ෂණ අනුව කොළඹ හින්දු විද්‍යාලයට 1 ශ්‍රේණිය සඳහා ක්‍රිස්තියානි ළමයෙකුට ප්‍රවේශ වීමට හැකියාවක් නොපවතින බවට කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර ඇත.

එහෙයින් මෙම පැමිණිල්ලේ පැමිණිලිකරුගේ දරුවා පිළිබඳව සළකා බැලීමේදී ඉහත කී චක්‍රලේඛයේ 7.2.4 වගන්තිය යටතේ සඳහන් පරිදි හින්දු විද්‍යාලයට එම දරුවාට ඇතුළත් වීමට හැකියාවක් නොමැත යන කාරණාව ඉතා පැහැදිලි ය. එ අනුව කොළඹ රාජකීය විදුහල විසින් මෙම පැමිණිලිකරු වෙත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීමේදී ' ප්‍රවේශ වීමට හැකි පාසල' සඳහා ලකුණු අඩු කිරීමේදී කොළඹ හින්දු විද්‍යාලය සඳහා ලකුණු අඩු කිරීම අවිධිමත් හා නිවැරදි නොවන බවට මෙම කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

ඒ අනුව, මෙම පැමිණිලිකරු වෙත කොළඹ රාජකීය විදුහල විසින් පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේ දී පදිංචිය සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ලේඛන සඳහා ලකුණු 6 ක් ද පදිංචිය සනාථ කිරීම සඳහා වූ අමතර ලේඛන සඳහා ලකුණු 1.85 ක් ද ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචිය සඳහා ලකුණු 25 ක් ද පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාවය සඳහා ලකුණු 15 ක් ද ලබා දී ඇති අතර ලබා දී ඇති මුළු ලකුණු ප්‍රමාණය 47.85 ක් වේ. නමුත් ඉහත නිරීක්ෂණයන් අනුව හින්දු විදුහල සඳහා ඉවත් කරන ලද ලකුණු 5 මෙම පැමිණිලිකරු වෙත ලබාදීම තුළින් එකී මුළු ලකුණු ප්‍රමාණය 52.85 දක්වා ඉහළ යන බැවින් සහ එම මුළු ලකුණු ප්‍රමාණය කඩඉම් ලකුණ වන 50 ට වඩා වැඩි ලකුණු ප්‍රමාණයක් වන බැවින් මෙම පැමිණිලිකරුගේ දරුවාට පාසලට ඇතුලත් වීමට අවස්ථාව හිමිවන බවට මෙම කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කෙරේ.

**නිගමනය**

ඉහත නිරීක්ෂණ අනුව කොළඹ හින්දු විද්‍යාලයේ 1 ශ්‍රේණිය සඳහා ක්‍රිස්තියානි ළමයෙකුට ප්‍රවේශ වීමට හැකියාවක් නොපවතින බැවින්, 02 වන වගඋත්තරකාර පාර්ශවය වන කොළඹ රාජකීය විදුහල විසින් 2025 වර්ෂයේ පළමු ශ්‍රේණිය සඳහා ළමුන් ඇතුලත් කිරීම සඳහා මෙම ක්‍රිස්තියානි ආගමිකයකු වූ පැමිණිලිකරු වෙත හින්දු විදුහල සඳහා ලකුණු 05ක් අඩු කිරීම තුලින් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) (2) ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති මුලික අයිතිවාසිකම් උල්ලංඝනය වි ඇති බවට නිගමනය කර සිටි.

**නිර්දේශය**

ඉහත සඳහන් සම්මුඛ පරීක්ෂණයේදි පදිංචි ස්ථානයේ සිට පාසලට ඇති ආසන්නතාවය සඳහා ලකුණු ලබාදිමේදි හින්දු විද්‍යාලය ඇතුළුව පාසල් 07කට ලකුණු 35ක් මෙම පැමිණිලිකරු වෙත අඩු කර ඇති අතර,

හින්දු විදුහල හැර අනෙක් පාසල් 6 සඳහා පමණක් ලකුණු 30ක් අඩු කර එම නිර්ණායකය සඳහා දැනට ලබාදී ඇති ලකුණු 15 ට අමතරව හිමිකම් ලබන තවත් ලකුණු 05 ක් ද එකතු කර ලකුණු 20 ලබා දිය යුතු ය.

එසේ ලබාදීම තුලින් පැමිණිලිකරුට දැනට ලබාදී ඇති ලකුණු 47.85 ක් වූ ලකුණු සංඛ්‍යාව 52.85 දක්වා ඉහල යන බැවින් එකී ලකුණු ප්‍රමාණය කඩඉම් ලකුණුවලට වඩා වැඩිවීම හේතුවෙන් පළමු ශ්‍රේණිය සඳහා පැමිණිලිකරුගේ දරුවා ඇතුලත් කර ගැනීමට කටයුතු කළ යුතු ය.

2025. 11 . 25 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරු වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම් දියයුතු වන අතර එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සළකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී. දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත : අධ්‍යක්ෂ (ජාතික පාසල්),
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

රේ/- අමාත්‍යතුමිය, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල.